// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2077/41 – 2018 ජුනි 29 වැනි සිකුරාදා – 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2015/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශවයක් වශයෙන්

ඒ. ඩබ්. කේ. පෙරේරා මයා, අංක 143/3, හොරණ පාර, මහවිල, පානදුර.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා

වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මැණික්දිවෙල, ශ්‍රී පේමරතන මාවත, අංක 22/1, එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

---

*මගේ අංකය:* IR/COM/01/2015/46.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්

ඒ. ඩබ්. කේ. පෙරේරා මයා, අංක 143/3, හොරණ පාර, මහවිල, පානදුර.

*සහ*

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි ඒ. ඩබ්. කේ. පෙරේරා මහතාට 1974 අංක 04 දරන සේවක මණ්ඩල චක්‍රලේඛය පරිදි වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමේ දී වන්දි මුදල් නොගෙවීමෙන් හා 2011.12.13 සිට 2012.05.02 දක්වා වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳ ව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 432

---

*මගේ අංකය:* IR/COM/05/2017/50.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳ ව –

*එක් පාර්ශවයක් වෙනුවෙන්*

අන්තර් සමාගම් සේවක සංගමය, 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (සේවකයින් 26 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශවය වෙනුවෙන්,*

ඇල්කෙමිහෙවි මෙටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 153 ඒ, කණ්ඩලම පාර, දඹුල්ල.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

---

*මගේ අංකය*: IR/COM/05/2017/50.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වෙනුවෙන්*

අන්තර් සමාගම් සේවක සංගමය, 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම (සේවකයින් 26 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වෙනුවෙන්*

ඇල්කෙමිහෙවි මෙටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 153 ඒ, කණ්ඩලම පාර, දඹුල්ල.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"2016-2017 වර්ෂ සඳහා වැටුප් වැඩිකිරීමක් ලබාදෙන ලෙස කරන ලද සාකච්ඡා අසාර්ථක වීම මත පසුව ගනු ලැබූ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් සේවකයින් සේවය හැර ගියා සේ ලිපි යොමු කර පහත නම් සඳහන් සේවකයින් 26 දෙනාගේ සේවය අවසන් කිරීම නිසා එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් එක් එක් සේවකයාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳ ව වේ.

01. ඒ.ජී. මහේෂ් ගුණතිලක
02. ඩබ්. කේ. අමිල සම්පත්
03. බී. ජී. නිශාන්ත ප්‍රනාන්දු
04. එම්. ජී. සමින්ද ජයරත්න
05. යූ. ජී. රංජිත් පෙරේරා
06. ආර්. එම්. ඒ. බණ්ඩාරනායක
07. ඒ. එම්. වසන්ත ගුණවර්ධන
08. ඒ. එච්. එම්. එස්. තිලකරත්න බණ්ඩාර
09. කේ. ජී. යූ. සම්පත් බණ්ඩාර
10. ඒ. එම්. ඒ. චමින්ද අධිකාරි
14. ටී. එම්. ජී. එස්.ධම්මික බණ්ඩාර
15. එස්. ඒ. වසන්ත කුමාර
16. යූ. ජී. චාමර ආරියසිංහ
17. එම්. එම්. ආර්. කුමාර විජේසිංහ
18. ජී. ජී. එන්. ජීවන්ත විජේසූරිය
19. එච්. පී. ඩී. එම්. කුමාර පතිරණ
20. එම්. ජී. කස්තුරි ප්‍රියනන්දන
21. ජේ. කේ. ජී. එච්. පී. කේ. රතනපාල
22. වී. ජී. ඩී. ලක්මාල් හේරත්
23. ඒ. ජී. ආර්. සම්පත් අධිකාරි

11. ඒ. ඩබ්. යූ. එන්. බණ්ඩාර
12. ආර්. එම්. එස්. වයි. බී.රාජකරුණා
13. යූ. ජී. කුලතුංග
24. එෆ්. ලියනගේ
25. ආර්. ඒ. එන්. රණතුංග
26. ජේ. ආර්. එස්. කුමාර ජයලත්

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 433

---

මගේ අංකය: IR/COM/01/2018/16.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

බර්නාඩ් සුනිල් කාරියවසම් මයා, අංක 181, ගාළු පාර, රත්මලාන

සහ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය:* IR/COM/01/2018/16.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

බර්නාඩ් සුනිල් කාරියවසම් මයා, අංක 181, ගාලුපාර, රත්මලාන.

සහ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සේවයේ නියුතු බර්නාඩ් සුනිල් කාරියවසම් යන අයට 2016.11.03 වැනි දින සිට වැඩ තහනමකට ලක්කර එම වැඩ තහනම් කල කාලය තුළ කිසිම වැටුපක් නොගෙවීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද? එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 434

---

*මගේ අංකය:* IR/COM/05/2018/40.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන් -*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02.

02. වීරසිංහ මෑන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

*අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,*

කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය:* IR/COM/05/2018/40.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වෙනුවෙන්-*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාක් වීදිය, කොළඹ 02.

02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 333ඒ, නුවර පාර, කිරිල්ලවල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

'' ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් ඌව කුඩා ඔය ගොවිපළෙහි සේවකයින්ට වයස අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමට ගෙන ඇති තීරණයෙන් සේවක පාර්ශ්වයට අගතියක් සිදු වී තිබේද, එසේ අගතියක් සිදුව ඇත්නම්, ලැබිය යුතු සහන කවරේද යන්න සහ 2018 ජනවාරි මාසයේදී වැඩ වර්ජනය කළ දින 15ට අදාළ වැටුප වැඩ වර්ජිත සේවකයින්ට හිමිවිය යුතු ද? යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.